# මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම

## ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් පුයිවට් ලිමිටඩ්,

## වීරසිංහගේ තාරක සදරුවන් වීරසිංහ

සහ

## තුෂාරි බුද්ධිකා විජේනායක

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2022.06.01 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී;

අ) අංක ඒ 12, අලුත් ඔය පාර, හොරොව්පතාන යන ස්ථානයේ පිහිටා ඇති ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් (පීවී00225992) යන සමාගම;

ආ) අංක 35, රළපනාව, හොරොව්පතාන, අනුරාධපුර යන ලිපිනයෙහි පදිංචි, ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වන වීරසිංහගේ තාරක සදරුවන් වීරසිංහ (912830357වී);

සහ

ඇ) අංක 64 ඒ, යාපනය පාර, අනුරාධපුර යන ලිපිනයෙහි පදිංචි, ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරියක වන තුෂාරි බුද්ධිකා විජේනායක (726201374වී)

යන අය විසින් එකී පනතෙහි ප්‍රතිපාදනයන් උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර සිදු කළ බවට සහ තැන්පතු භාරගත් බවට තීරණය කර ඇති බව මුදල් ව්‍යාපාර පනතෙහි 42 (10) වන වගන්තිය යටතේ මහජන සුභසිද්ධිය පිණිස මහජනයා වෙත දැනුම් දීම සඳහා මෙම දැන්වීම පළකරනු ලැබේ.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඉහතින් සඳහන් කරන ලද සමාගමට හා පුද්ගලයින්ට;

අ) තවදුරටත් ආයෝජන සැලසුම් නිකුත් කිරීම හරහා හෝ වෙනත් කිසිදු ආකාරයකින් තැන්පතු භාරගැනීම සහ මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සිදු නොකරන ලෙසටත්;

සහ

ආ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගම් නාම ලේඛනයෙන් ඩබ්ලිව් ටී එස් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ නම කපා හැරී බවට පිළිගත හැකි සාක්ෂි 2022.12.01 දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලෙසටත්

විධාන කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විටත් ඉහතින් සඳහන් කරන ලද සමාගමට සහ පුද්ගලයින්ට කිසිදු ආකාරයකින් තැන්පතු හෝ මුදල් කැඳවීම සහ රැස්කිරීම, වත්කම් බැහැර කිරීම / අන්සතු කිරීම, යම් ගිණුමකට, දේපළකට, ආයෝජනයකට හෝ සම්බන්ධ ගණුදෙනුවකට ඇතුළුවීම තහනම් කරමින් එවැනි කටයුතු ක්‍රියාවිරහිත කිරීමේ නියෝග නිකුත් කර ඇත.

**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

දුරකථන: 011-2477504, 011-2398860, 011-2398863 විද්‍යුත් ලිපිනය: dsnbfi@cbsl.lk වෙබ් අඩවිය: http://www.cbsl.gov.lk